# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සරවනපවන් පදනම (සංස්ථාගත කිරීමේ)

**සරවනපවන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

යාපනය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා විසින්
2016 ඔක්තෝබර් මස 25 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 සැප්තැම්බර් මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[143 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## සරවනපවන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''සරවනපවන් පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2016 අංක        දරන සරවනපවන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සරවනපවන් පදනම සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) සරවනපවන් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සරවනපවන් පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කෘෂිකාර්මික ආනයන, අපනයන, වාණිජ හා වෙනත් අංශවල ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමෙහි ලා තැනැත්තන් දිරිමත් කිරීම හා ඔවුනට සහාය දීම සහ ඒ තැනැත්තන්ට අවශ්‍ය පුහුණුව හා කාර්මික සහාය ලබා දීම;

(ආ) පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිවලට ආධාර දීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ වෙනත් යම් විදේශීය හෝ දේශීය ආයතනයක් හෝ දේශීය ආයතනයක් සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යයන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඉ) ගෘහ කර්මාන්ත සහ ස්වයං සේවා නියුක්ති සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඊ) පුස්තකාල, ලේඛන ආරක්ෂකාගාර සහ ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වල සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ඒවා සුරක්ෂිත කරන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම;

(උ) ළමයින්ගේ, කාන්තාවන්ගේ සහ අනාථ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ශුභසාධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඌ) මාර්ග සංවර්ධන සහ නිවාස යෝජනා ක්‍රම, ආරෝග්‍යශාලා, පාඨශාලා සහ වෙනත් අධ්‍යාපන මධ්‍යස්ථාන සහ ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම වැනි සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම;

(ඍ) මාධ්‍ය ආයතනයන්ට උදව් කිරීම සහ ඒවා සමග සහයෝගයෙන් කටයුතු කිරීම; සහ

(ඌ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඒ අතුරෙන් යම් පරමාර්ථයක් හෝ මුදුන්පත් කරගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) අරමුදල් රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රධාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත් කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදිකිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයක සංස්ථාගත කළ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග හෝ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, මණ්ඩලයක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන තවත් දෙදෙනකුගෙන් යුත් සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම දිනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මියයාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධූරය අත්හළහොත් මිස, අවුරුදු පහක කාලයක් සඳහා ධූරය දැරිය යුතු ය. මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත් කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු පහක් ධූර දැරිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද කළමනාකරණ මණ්ඩලය තෝරා පත්කර ගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දයක් මුදල් හෝ ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපළ කවර ස්ථානයකින් උපලබ්ධි වූව ද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපළවලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

සංස්ථාවේ විගණනය හා ගිණුම්.

8. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්,—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයන් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ සභාපති හා ලේකම් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් සහ සංස්ථාවට ගෙවිය යුතු මුදල්.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින්, ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල සහ චංචල දේපළ දැරිය හැකි බව.

**11.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා

වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.